ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022-12-21

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | ඩබ්. ඒ. අනුරසිරි විතානආරච්චි මහතා<br>නො. 295/2, කැදවලමඩිත්ත,<br>ගුරුදෙණිය. |
| වගඋත්තර පාර්ශවය | : | 01. ස්ථානාධිපති,<br>පො. ප. අරුණ ක්‍රිශාන්ත,<br>පොලිස් ස්ථානය,<br>තලාතුඔය. |
| | | 02. පො. ප. සමන් කුමාර මයා,<br>පොලිස් ස්ථානය,<br>තලාතුඔය. |
| | | 03. පො. සැ. 21631 පුංචිරත්න මයා,<br>පොලිස් ස්ථානය,<br>තලාතුඔය. |
| | | 04. පො. කො. 57746 ජයකොඩි මයා,<br>පොලිස් ස්ථානය,<br>තලාතුඔය. |
| | | 05. පො. කො. 73765 සමරකෝන් මයා,<br>පොලිස් ස්ථානය,<br>තලාතුඔය. |
| | | 06. පො. කො. 78429 බංඩාර මයා,<br>පොලිස් ස්ථානය,<br>තලාතුඔය. |

පැමිණිලි අංකය - HRC/K/193/19/ඒ




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி: 94 -11-2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர்: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ක්ෂණික / துரித அழைப்பு: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம்: www.hrcsl.lk

**පැමිණිල්ලේ සැළකිරීම :-**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් කියා සිටින්නේ, තමා තලාතුඔය පොලිසියේ පොලිස් පරික්ෂකයෙකුට අයත් වැලි අදින ලොරියක රියදුරකු සේ සේවය කරමින් සිටි බවත්, රාත්‍රියේදී එකී ලොරිය තම නිවස ඉදිරිපිට ගාල් කරන බවත්, ලොරි රථයේ ආරක්ෂාවට තමා එකී ලොරි රථයේම රාත්‍රියේ නිදාගන්නා බවත්, 2019.04.01 දින තමා ලොරි රථයේ නිදාගෙන සිටියදී පොලිස් නිළධාරියෙකු නැග හෙල්මට් එකකින් තමාගේ හිසට පහරදුන් බවත්, එසේ පහර දී තමා ලොරි රථයෙන් එළියට ඇද දමා තමාට පහරදුන් බවත්, මෙම සිද්ධිය තමාගේ පුතා විසින් වීඩියෝ කරමින් සිටියදී එම දුරකථනයද රැගෙන කඩා දැමූ බවත්ය.

ඉන්පසුව තමාට ඉතා අමානුෂික ලෙස පහරදෙමින් ජීප් රථයට දමාගෙන පොලිස් ස්ථානයට ගොස් සිරමැදිරියට දැමූ බවත්, ඒ වන විටත් පහරදීමෙන් තමා අසීරුවෙන් සිටි බවත්, පසුදා උදේ තලාතුඔය පොලිස් ස්ථානාධිපති පැමිණ තමාව සිර මැදිරියෙන් එළියට ගෙන ඔහුද පහර දුන් බවත්, තමා සේවය කරන ලොරියේ අයිතිකරු වන රණවීර යන අය පොලිස්ථානයට පැමිණ තමාව රෝහලට ගෙන යන ලෙස පොලිස් නිළධාරීන්ට දන්වන ලද බවත්, පසුව තලාතුඔය රෝහලට ගෙන ගොස් දිස්ත්‍රික් වෛද්‍ය නිළධාරී වෙත යොමු කළ බවත්, රෝහලට රැගෙන යන අතරතුර තමාගේ ඇස් රතු වී ඉදිමී තිබූ බවත්, ඔළුවේ හා ඉලඇට ප්‍රදේශයේ දරුණු වේදනාවක් පැවති බවත් සඳහන් කර ඇත. 2019.04.02 දින තමාව අධිකරණයට ඉදිරිපත් කළ පසුව බන්ධනාගාර ගත කළ අතර, එම අවස්ථාවේ තමාගේ සෞඛ්‍ය තත්වය අයහපත් හෙයින් එහි නිළධාරීන් බන්ධනාගාර රෝහලට ඇතුළත් කළ බවත්, පසුව තමා නැවත අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් ඇප මත නිදහස් වූ බවත් සඳහන් කර ඇත.

මේ වන විටත් තමාට පොලිස් නිළධාරීන් පහරදීම හේතුවෙන් ඇවිද ගැනීමටවත් නොහැකි තත්වයට පත්ව ඇති අතර, රැකියාවකට යාමට නොහැකි වීමෙන් මහත් ආර්ථික අපහසුතාවලට මුහුණ දීමට සිදුව ඇති බවත්, එබැවින් තමාට අමානුෂික ලෙස පහරදි අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර සාධාරණයක් ඉටු කරන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවීය සැළකිරීම :-**

පැමිණිල්ලට අදාළ වගඋත්තර පාර්ශවය තලාතුඔය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් කොමිසම වෙත යොමු කර ඇති වාර්තාවේ සඳහන් වන්නේ, පැමිණිලිකරු 2019.04.02 වන දින පැය 0015 ට අංක CPLI 8129 දරණ ටිපර් රථය බීමත්ව අපරික්ෂාකාරී ලෙස පදවමින් සිටියදී තමාගේ ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපති පො.ප. සමන් කුමාර, පො.සැ. 21631 පුංචිරත්න, පො.කො. 78492 බංඩාර, පො.කො. 57746 ජයකොඩි, පො.කො. 73765 සමරකෝන්, සහ පො.කො.රි 80744 මධුසංඛ යන නිළධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කර ඇති බවයි.

මෙම අත්අඩංගුවට ගැනීම අසල්වැසි පුද්ගලයෙක් විසින් පො.ප. සමන්කුමාර නිළධාරියාට දුන් දුරකථන පණිවිඩයක් අනුව සිදුකළ බවත්, මොහු කාලයක් තිස්සේ මත්පැන් පානය කර බීමත්ව රිය පදවන බවටත් නිවසේද බීමතින් අසල්වැසියන්ට හිරිහැර කරදර සිදුවන පරිදි හැසිරෙන පුද්ගලයකු බවටත් විමර්ශනයේදී අනාවරණය වූ බවත් දක්වා ඇත.

අදාළ අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ පැමිණිලිකරු බීමත්ව සිටි බව ඇල්කොටෙක් නල පරීක්ෂාව මඟින් තහවුරු වූ අතර, අධිකව බීමත්ව සිටි බැවින් ඔහුට ඔහුවම පාලනය කර ගැනීමට නොහැකිව සිටි බවත්, සැකකරු ස්ථානයේ සිර මැදිරියේ රඳවා සිටියදී ඇඳිවත පවා ශරීරයේ නොතිබූ බවත්, ඔහුගේ හිස ඔහු සිරමැදිරියේ යකඩ දොරේ ගහගනිමින් තුවාල කර ගත් බවට එම අවස්ථාවේ රාජකාරියේ සිටි නිළධාරියා සටහන් තබා ඇති බවත් දක්වා ඇත.

සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර තලාතුඔය රෝහලේ දිස්ත්‍රික් භාර වෛද්‍ය නිළධාරී වෙත ඉදිරිපත් කර බීමත් බව පරීක්ෂාවට  ලක්කර ඇති බවත්, එහිදී ශාරීරික හානියේ ස්වභාවය වශයෙන් තැලීම් තුවාල වශයෙන්ද පීඩාවේ ප්‍රභේද බරපතල නොවන ලෙසට සහ මධ්‍යසාර පිළිබඳ මත් වී ඇති බවට සටහන් කර ඇති බවද සඳහන් කර ඇත.

ඒ අනුව අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු සැකකරු රක්ෂිත බන්ධනාගාර ගත කරන ලද අතර, නැවත නඩුව කැඳවන තෙක් රියදුරු බලපත්‍රය අධිකරණය විසින් අත්හිටුවන ලද බවත්, එසේ රියදුරු බලපත්‍රය අත්හිටුවීම හේතුවෙන් පොලිස් නිළධාරීන් කෙරෙහි ඇති ද්වේශයෙන් මෙම පැමිණිල්ල කර ඇති බවත්, කිසිවිටෙකත් පහරදීමක් සිදුකර නොමැති බවත් වැඩිදුර දන්වා ඇත.

**විමර්ශන හා පරීක්ෂණ කටයුතුවලදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකරු සිද්ධිය සිදු වී ඇති 2019.04.01 දින රාත්‍රී ආහාර ගැනීමෙන් පසු නිවස ඉදිරිපිට නවතා තිබූ ලොරි රථයේ නිදාගෙන සිට ඇති බවද, වගඋත්තරකාර පොලිස් නිළධාරීන් එදින රාත්‍රී 10.00 ට පමණ පැමිණිලිකරු නිදා සිටි ලොරි රථයට ගොඩ වී පහර දී ඇති බවද පැමිණිල්ලේ කරුණු අනුව දක්වා ඇත. සිද්ධිය සිදුවන අවස්ථාවේ නිවසේ සිට ඇති පැමිණිලිකරුගේ පුත්‍රයන් දෙදෙනා හා භාර්යාව විසින් ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශය මඟින් මෙම පහරදීම සිදු වී ඇති බවට සාක්ෂි සපයා ඇත.

පහරදීම හේතුවෙන් පැමිණිලිකරු මහනුවර මහ රෝහලින් ප්‍රතිකාර ලබාගෙන ඇති අතර, ඔවුන්ගේ අධිකරණ වෛද්‍ය වාර්ථාව අනුව බරපතල නොවන තුවාල 4ක් වාර්තා කර ඇත.

- දකුණු ඇසට හානි වී තිබීම.
- සෙ.මී. 2×3 ප්‍රමාණයේ සිරීම් තුවාල මුහුණේ වම් පස පහළ කොටසේ තිබීම හා මුඛය විවෘත කිරීමට අපහසු වීම හා වේදනාවක් ඇතිවීම.
- සෙ.මී. 4×3 ප්‍රමාණයේ සීරීම් තුවාලයක් පපුවේ වම්පස තණපුඩු ආසන්නයේ පිහිටා තිබීම.

පොලිස් වාර්තාව අනුව පැමිණිලිකරු විසින් ඔහුගේ හිස සිර මැදිරියේ ගසා ගැනීම හේතුවෙන් තුවාල සිදු වී ඇති බව ප්‍රකාශ කරන නමුත්, පැමිණිලිකරු දක්වනුයේ තම මුහුණට හෙල්මට් එකකින් පහරදුන් බවයි. වෛද්‍ය මතය වී ඇත්තේ මොට ආයුධයකින් කළ පහරදීමකි. ඒ අනුව පැමිණිලිකරු දක්වන පහරදීම් ආකාරය හා තුවාල සැසදෙන බව නිරික්ෂණය වේ.

තවද මෙම අත්අඩංගුවට ගැනීම සිදු කර ඇත්තේ, පැමිණිලිකරු බීමත්ව සිය ලොරි රථය පදවාගෙන යන බවට ලැබුණු දුරකතන ඇමතුමක් අනුව බව පොලිස් නිලධාරීන් සඳහන් කළද ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව තහවුරු වන්නේ මෙම අත්අඩංගුවට ගැනීම නිවස අසල ලොරි රථයේ නිදාගෙන සිටියදී පහරදී සිදුකර ඇති අත්අඩංගුවට ගැනීමක් වන බවයි.

**පරික්ෂණයේදී පැමිණිලිකරු විසින් තමන්ට පහරදුන් නිළධාරීන් ලෙස ස්ථානාධිපති පො.ප. අරුණ ක්‍රිෂාන්ත, පො.කො. 57746 ජයකොඩි හා පො.කො. 73765 සමරකෝන් යන නිළධාරීන් හඳුනාගැනීම මගින් අදාළ නිළධාරීන් පැමිණිලිකරුට පහර දී ඇති බව තහවුරු වේ.**

**නිගමනය :-**

වගඋත්තරකාර පොලිස් නිළධාරීන් විසින් පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන පහර දීමෙන් පැමිණිලිකරුට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති 'කෲර වධහිංසාවකට හෝ අවමන් සහගත සැළකිල්ලකට භාජනය නොවීමේ අයිතිවාසිකම' යන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, වගඋත්තර පාර්ශවයේ මෙකී ක්‍රියාකාරකම හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් වගකිවයුතු **ස්ථානාධිපති පො.ප. අරුණ ක්‍රිෂාන්ත, පො.කො. 57746 ජයකොඩි හා පො.කො73765 සමරකෝන්** යන වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීමට මෙම නිර්දේශයේ පිටපතක් පොලිස්පති වෙත සහ නීතිපති වෙත යොමු කරනු ලැබේ.

2023. 01 . 23 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A-Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commission of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත : 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. නීතිපතිතුමා,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

03. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

} ඉහත නිර්දේශය අනුව කටයුතු කිරීමට (02, 03)

B/